රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2021(IV)

මගේ අංකය : EST-6/03/LEA/3381
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.08.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## <u>රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම</u>

දැනට රටේ පවතින කොවිඩ් - 19 වෛරසයේ සීඝ්‍ර ව්‍යාප්තිය පිළිබඳව සහ සෞඛ්‍ය බලධාරීන් මෙන්ම වෘත්තිකයින් ඇතුලු විවිධ පාර්ශව විසින් කරන ලද ඉල්ලීම් පිළිබඳව සලකා බැලීමෙන් පසුව 2021.07.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(III)හි 03 හා 04 ඡේදවල විධිවිධාන හැර අනෙකුත් විධිවිධාන පහත පරිදි සංශෝධනය කෙරෙන අතර, ඒ අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ආයතන වෙත නිලධරයන් කැඳවීමේ දී මෙම සංශෝධිත විධිවිධාන අනුව කටයුතු කළ යුතු ය.

02. සියලු ම රාජ්‍ය ආයතනවල නිලධරයන් එක් නිලධරයෙකු අවම වශයෙන් සතියකට දින 03ක් සේවයට වාර්තා කළ යුතු වන ආකාරයට කණ්ඩායම් සකසා එම කණ්ඩායම් ආයතනයේ සේවය අඛණ්ඩව සැපයීමට හැකි ආකාරයට සේවයට කැඳවිය යුතු ය.

03. ඉහත පරිදි කණ්ඩායම් ලෙස සේවය සඳහා කැඳවන අවස්ථාවන්හි දී යම් නිලධරයෙකු සේවයට වාර්තා කළ යුතු දිනයක සේවයට වාර්තා නොකළේ නම් පමණක් එම දිනය ඔහුගේ පෞද්ගලික නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතු ය.

04. නිල ප්‍රවාහන පහසුකම් හෝ සංචිත වාහන මඟින් ප්‍රවාහන පහසුකම් ලබා දෙනු ලබන මාණ්ඩලික නිලධරයන් සඳහා ඉහත සේවා මුර ක්‍රමය අදාළ නොවන අතර ආයතන ප්‍රධානීන්ගේ අභිමතය පරිදි ඔවුන් සේවයට වාර්තා කළ යුතු ය.

05. සේවා මුර ක්‍රමයට හෝ සේවයට කැඳවීමට අනුගමනය කරන විධිමත් ක්‍රමවේදයට අනුව සේවයට නොකැඳවූ දිනයක දී වුව ද සෑම රජයේ නිලධරයෙකුම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ස්වකීය රාජකාරියට අදාළ කාර්යයන්හි යෙදීමට බැඳී ඇති අතර, ආයතන ප්‍රධානියාගේ උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය.

06. ඉහත සඳහන් උපදෙස් පරිදි රාජ්‍ය ආයතන වෙත නිලධරයන් කැඳවීමේ දී ගර්භණී නිලධාරිනියන් සහ වයස අවරුදු 01ට අඩු ළදරුවන් සිටින මව්වරුන් සේවයට නොකැඳවීමට පියවර ගත යුතු ය. තව ද, සැක කටයුතු රෝග ලක්ෂණයකින් පෙළෙන බවට අනුමාන කළ හැකි අයවලුන් සහ වෙනත් විශේෂිත කරුණු හේතුවෙන් සේවයට කැඳවීමට යෝග්‍ය නොවන බවට සාධාරණ හේතු ඉදිරිපත් කරන අයවලුන් සේවයට කැඳවීම හෝ විකල්ප කාර්යාලයීය සේවාවන් යොදා ගැනීම, නිවසට ආසන්න ස්ථානයක සේවය කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා දීම ආදී වශයෙන් අදාළ සේවකයාගේ සුබසිද්ධිය ද ඉටු වන පරිදි නම්‍යශීලීව තීරණය කිරීමේ වගකීම ඒ ඒ ආයතන/ අංශ ප්‍රධානීන් වෙත පැවරේ.

07. මාණ්ඩලික හා සෙසු නිලධරයන් සේවයට වාර්තා කිරීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ ඍජු අධීක්ෂණය යටතේ පැමිණීමේ හා පිටවීමේ ලේඛනයක් පමණක් නඩත්තු කිරීම ප්‍රමාණවත් වේ.

08. ඉහත 02හි සඳහන් ආකාරයට පරිබාහිරව, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අයත් නිලධරයන් සේවයට කැඳවිය යුතු වන්නේ නම් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අවශ්‍ය උපදෙස් ලබා දෙනු ඇත.

09. නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් ආයතනික කාර්ය මණ්ඩලය මෙන්ම සේවාලාභීන් ද කොවිඩ් - 19 වෛරසය ආසාදනය වීමෙන් වළක්වා ගනිමින් සේවා සැපයීමේ වගකීම ආයතන ප්‍රධානීන් වෙත පැවරෙන අතර, සෞඛ්‍ය උපදෙස් අනුව අනිවාර්යයෙන්ම කළ යුතු මුව ආවරණ පැළඳීම පිළිබඳව මෙන්ම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ද විශේෂ අවධානයක් යොමු කරමින් සේවා ස්ථානවල සියලු සෞඛ්‍ය ආරක්ෂිත පියවර දැඩිව අනුගමනය කිරීමට ආයතන/ අංශ ප්‍රධානීන් කටයුතු කළ යුතු ය.

(අ) ආයතනයේ සියලුම සේවා ස්ථාන විශේෂයෙන් පොදු ස්ථාන, කවුන්ටර් වැනි ස්ථාන, කෑම කාමර, කාර්යාලයීය ආපන ශාලා, වැසිකිළි සහ හවුල් අවකාශයන් දෛනිකව සහ සතිපතා පිරිසිදුව හා සනීපාරක්ෂකව නඩත්තු කළ යුතු ය.

(ආ) සේවකයින් සහ සේවාදායකයින් විසින් අනුගමනය කළ යුතු සෞඛ්‍යමය සහ සනීපාරක්ෂක මාර්ගෝපදේශන පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කළ යුතු ය.

(ඇ) නිතිපතා මහජනතාව පැමිණෙන කාර්යාලවල පරිශ්‍රයට ඇතුළුවීමට පෙර ශරීරයේ උෂ්ණත්වය පරීක්ෂා කිරීම, අත් සේදීම වැනි සනීපාරක්ෂක ක්‍රම අනුගමනය කිරීමට පහසුකම් සැපයිය යුතු ය.

(ඈ) සේවා ලබා ගැනීම සඳහා පැමිණෙන මහජනතාව සීමිත ඉඩ ප්‍රමාණවල රැස්වීමෙන් ඇතිවන තදබදය කළමනාකරණය කිරීමට සෞඛ්‍යය ආරක්ෂිත ක්‍රමවේදයන් නිරන්තරයෙන් පරීක්ෂා කළ යුතු ය.

(ඉ) මෙම කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට නිශ්චිත බලය සහිත නිලධරයෙකු පත් කළ යුතු ය.

10. යම් රජයේ නිලධරයෙකු පවතින තත්ත්වය තුළ නිරෝධායන රෙගුලාසි යටතේ නිරෝධායනයට යොමු කර ඇත්නම් හා එසේ නිරෝධායනය සඳහා යොමු කර ඇත්තේ රජයේ නිරෝධායන නීති රීති උල්ලංඝනය කිරීමෙන් වන දඬුවමක් ලෙස නොවන්නේ නම් එවැනි නිලධරයන් සඳහා එම නිරෝධායන කාලසීමාව ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 12:9 උප වගන්තියෙහි විධිවිධාන පරිදි සම්පූර්ණ වැටුප් සහිත කාලසීමාවක් ලෙස සැලකිය යුතු ය.

11. මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර බලාත්මක වූ චක්‍රලේඛ විධිවිධාන අනුව රාජ්‍ය නිලධරයන් සේවයට කැඳවූ කාලසීමාව තුළ ඔවුන් ලබාගත් නිවාඩු ඔවුන්ගේ සේවය ස්ථිර කිරීම්, උසස්වීම් ලබාගැනීම් හා විශ්‍රාම ගැන්වීම් කටයුතු සඳහා අදාළ කරගැනීම පිළිබඳව උපදෙස් ඉදිරියේ දී නිකුත් කරනු ලැබේ.

12. නිලධරයන් බාධාවකින් තොරව සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි අදාළ බලධරයන් විසින් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව පොදු ප්‍රවාහන සේවා යථා පරිදි ක්‍රියාත්මක කරනු ඇත.

13. මෙතෙක් එන්නත් ලබා දී නොමැති සියලු රජයේ නිලධරයන් එන්නත්කරණයට ලක් කිරීමේ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රමුඛතාව ලබා දී සිදු කරනු ඇත.

14. දැනටමත් හදිසි හා අත්‍යාවශ්‍ය සේවා සපයන ආයතනවල රාජකාරි කටයුතු සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධාන බාධාවක් නොවිය යුතු ය. සැම විටම මහජන සේවා සම්පාදනයන් ප්‍රමුඛ කාර්යය සේ සලකා තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉටු කිරීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු ය.



ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය